*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 17-Iss.I, June 2026, 175-184.*
*DOI: https://doi.org/10.4038/p.v17i1.93*

# මෑත කැණීම්වලින් අනාවරණවය වූ අභයගිරි දාගැබෙහි නැගෙනහිර පොකුණ හා ඒ අසලින් හමු වූ ශිලා ලේඛනය පිළිබඳ අධ්‍යයනයක්

# [A Study on the Newly Excavated Eastern Pond and the Inscription Found Nearby at the Abhayagiri Sthupa]

**H.A. Nilanka Udara Jayrathna[1] Karunasena Hettiarachchi[2]**
**Thusitha Mendis[3] K.P.H. Randika[4] D.M.S.M. Dissanayaka[5]**

## Abstract

A pond can be observed near the main entrance pavilion situated on the four cardinal directions of the Abhayagiri Stupa. As this pond had not been subjected to scientific excavation or proper conservation, archaeological excavations of the pond located on the eastern side were commenced in March 2025. The initial phase of the excavation was completed in September of the same year. During this process, several architecturally and archaeologically significant features were uncovered. In October, conservation work was carried out using stone slabs found within the pond in order to protect the structural features such as the steps and embankments. During this process, a portion of a stone inscription was discovered near the steps. This research is conducted with the aim of examining whether the content of the inscription can contribute to understanding the functional usage of the pond. The primary objective of this study is to analyze the findings revealed through the excavation of the pond at Abhayagiri Monastery and to examine the content of the stone inscription. The research methodology is based on primary source analysis, field observation, and comparative study, employing a qualitative approach. The exact shape of the excavated pond has not yet been clearly determined. Two entrances to the pond can be identified: a main entrance with a pavilion on the eastern side and a secondary entrance on the southern side. Based on the paleographic features of the script, the discovered inscription can be dated approximately to the 3rd century CE, and it consists of four lines of writing. Although the information revealed is limited, it can be concluded that these findings will be highly significant for future studies related to the history of Abhayagiri.

**Keywords:** Abhayagiri Stupa, Inscription, Pond, Excavation, Future Studies

1. Senior Archaeoloy Officer, Polonnaruwa Projecr, Central Cultural Fund, Sri Lanka.
   E-mail:nilankaarch@bpu.ac.lk https://orcid.org/0009-0001-0565-1457
2. Prof. University of Sri Jayewardenepura
3. Prof. Rajarata University of Sri Lanka
4 Central Cultural Fund, Sri Lanka.
5 Central Cultural Fund, Sri Lanka.

Received: 15 February 2026, Accepted revised version: 10 May 2026.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

අනුරාධපුර අවධියේ විහාරාරාම අතර ආගමික සංස්කෘතික මෙන් ම දේශපාලනික වශයෙන් ද වැදගත් වන බෞද්ධ ආරාමික මධ්‍යස්ථානයක් වශයෙන් අභයගිරි මහා විහාරය හඳුනාගත හැකි ය. වංසකතා සාධකවලට අනුව මෙම විහාරයෙහි ආරම්භය සිදු ව ඇත්තේ වට්ටගාමි අභය (වළගම්බා) රාජ්‍ය සමයේ (ක්‍රි.පූ. 89-77) දී ය (මහාවංශය 1967: 33, 83). ෆාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාවට අනුව ක්‍රි.ව. 5 වන සියවස පමණ වන විට භික්ෂූන් පන් දහසක් (5000) අභයගිරි විහාරයෙහි වාසය කර ඇත (පාහියන්ගේ දේශාටන වාර්තාව 1958: 93). අභයගිරි විහාර සංකීර්ණය දළ වශයෙන් හෙක්ටයාර් දෙසිය පනහකට (250) වැඩි භූමි ප්‍රමාණයක ව්‍යාප්ත ව පැවතිණි. එහි වැඩසිටි මහා සංඝරත්නයේ සහ විහාර පරිශ්‍රයේ දෛනික ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විවිධ ප්‍රමාණයේ සහ හැඩයේ පොකුණු 65ක් පමණ අභයගිරි විහාර පරිශ්‍රයෙන් අනාවරණය වී ඇත. මෙම පොකුණු අතර ප්‍රධාන ස්තූපයට ආසන්න ව සතර දෙසින් නිමවා ඇති පොකුණු හතර විශේෂ වැදගත්කමකින් යුක්ත වේ (සැලසුම අංක 01). වර්ෂා කාලයේ දී දාගැබ් මළුවට එකතු වන ජලය විධිමත් කාණු පද්ධතියෙන් මෙම පොකුණු වෙත යොමු කර ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක බටහිර දිග පොකුණෙන් පැහැදිලි ව ලැබී ඇත. ස්තූපයට ප්‍රවේශ වන දොරටු මණ්ඩප අසල ඉදි කර ඇති මෙම පොකුණු අතුරින් දකුණු දිශාවේ පොකුණ 1980 දශකයේ දීත් උතුරු පොකුණ 2016 වර්ෂයේ දීත් කැණ පාදා සංරක්ෂණය කරන ඇත. මෙම පර්යේෂණයට භාජනය වන නැගෙනහිර පොකුණ 2025 මාර්තු මාසයේ දී මතුකර සංරක්ෂණය කිරීමේ කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ආරම්භ කරන ලදි.

## පර්යේෂණ ගැටලුව

අභයගිරි දාගැබට නැගෙනහිර දෙසින් වූ පොකුණ සමස්ත ආරාමික භූ දර්ශනය සහ ජල කළමනාකරණ පද්ධතිය සමඟ කවරාකාර බද්ධතාවක් පවතින්නේ ද? කැණීමෙන් හමු වූ ශිලාලේඛනය එම පොකුණෙහි හෝ අභයගිරි විහාරයෙහි ආර්ථික හා ආරාමික භික්ෂූගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීමට භාවිත කළ ක්‍රමවේද හඳුනා ගැනීමට කෙසේ උපකාර වන්නේ ද? යන ගැටලු ඔස්සේ පර්යේෂණය මෙහෙයවනු ලැබේ.

## පර්යේෂණ අරමුණු හා ක්‍රමවේදය

පොකුණෙහි නිර්මාණ ලක්ෂණ තේරුම් ගැනීම හා ශිලාලේඛනයේ අන්තර්ගතය විමසා බැලීම සහ ලිපියේ කාලය, දායකත්වය මෙන් ම පරිත්‍යාගයේ ස්වභාවය හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ වන්නේ ය. පොකුණ පාදා ගැනීමට අගල් කැණීම් ක්‍රමය හා පසෙහි වර්ණය, ව්‍යූහය සහ සංයුතිය වෙනස් වීම පදනම් කරගත් ස්තර අධ්‍යයනය භාවිත කළ අතර හඳුනාගත් දත්ත විශ්ලේෂණය සඳහා මූලාශ්‍රය අධ්‍යයනය, ක්ෂේත්‍ර නිරීක්ෂණය හා සිද්ධි අධ්‍යයනය ආශ්‍රය කර ගෙන ගුණාත්මක විධි ක්‍රමය පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

කැනීම සඳහා තෝරා ගත් පොකුණ ස්වාභාවික සංසිද්ධි හේතුකොටගෙන ගරාවැටීමට ලක් ව පතහක් මෙන් පෙනෙන්නට තිබිණි. එහි බටහිර කොටස පෙර අවස්ථාවල දී දාගැබෙහි සුන්බුන් ගෙනැවිත් දැමීම හේතුවෙන් ගොඩැල්ලක් මෙන් පෙනෙන්නට තිබිණි. එම පස් සේදී ගොස් කාලයාගේ ඇවෑමෙන් නටබුන් පොකුණ සැලකිය යුතු තරම් පසින් වැසී පැවතීම නිසා එහි වාස්තුවිද්‍යාත්මක ස්වරූපයන් පිළිබඳ අදහසක් ලබාගැනීමට දුෂ්කර ව පැවතුණි (ඡායාරූප අංක 01). කැණීමෙන් අනුක්‍රමයෙන් පොකුණේ

ඉදිකිරීම් සාධක මතු විය (ඡායාරූප අංක 02, 03). කැණීමෙහි එක් ප්‍රධාන අරමුණක් වූයේ ඓතිහාසික භූ දර්ශනය හඳුනාගැනීම ය. මතුපිට පස් ස්තරය කාබනික ද්‍රව්‍ය සහ මෑත කාලීන රොන් මඩ සහිත පසින් සමන්විත විය. නැගෙනහිර දෙසින් වූ පස් ස්තරවල බහුල ව විතැන් මැටි බඳුන් කැබලි තැන්පතු හමු විය. මව් පාෂාණය මත දක්නට ලැබුණේ පස් ස්තර දෙකක් පමණි. දෙවන ස්තරය කලවම් පස් සහ සුන්බුන් සහිත වූ අතර උතුරු සහ බටහිර කලාපවල මෙම ස්තරය ඉතා ගැඹුරට විහිද තිබුණි. එහි ස්තූපයේ ප්‍රතිසංස්කරණ අවස්ථාවල දී ඉවත් කරන ලද ගඩොල්, උළු සහ හුණු බදාම කැබලිවලින් සමන්විත විය. පොකුණෙහි මධ්‍යයට වන්නට පිහිටි ගල එහි පතුල ගැඹුරු කර ගැනීම සඳහා හාරා ඇති අයුරු ද දැකගත හැකි විය. උතුරු හා බටහිර සුන්බුන් ගොඩැලි නාය යාමෙන් සැලකිය යුතු කොටසක කලවම් පස් ස්තරයක් නිර්මාණය වී ඇත. දකුණු දෙසින් ස්තූපයේ සිට සමාධි පිළිමය දෙසට ගමන් කරන පෙත්මඟ සැකසීමෙ දී ඉවත් කළ සුන්බුන් ද පොකුණ දෙසට සෝදා ගිය බවට සාධක විය.

පොකුණ ආශ්‍රිත කලාපයට අයත් පුරාවිද්‍යාත්මක මැදිහත්වීම් පිළිබඳ කරුණු පරීක්ෂාකිරීමේ දී කරුණු කීපයක් අනාවරණය කරගැනීමට හැකි විය. 1982 මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මක වුණු අභයගිරි ව්‍යාපෘති කැණීම් වාර්තාවල ඇතුළත් සිතියම්වලට අනුව බ්‍රිතාන්‍ය සමයෙහි තාර දමා සකස් කළ පැරණි වට වන්දනා පාර තිබී ඇත්තේ මෙම පොකුණ ආසන්නයෙන් ඊට බටහිර දිසාවෙනි. (***Second Report of the Archaeological Excavetions*** 1992: 7). පොකුණ කැණීමේ දී දෙවන ස්තරයෙන් එම සාධක මතුකර ගතහැකි විය. ඒ අනුව දෙවන ස්තරයේ සැකැස්ම 1982 වර්ෂයෙන් පසුව ස්තූපයේ පස් ඉවත් කිරීමේ දී ගොඩගැසී ඇති බව හඳුනාගත හැකි විය. ස්තර අධ්‍යයනයේ දී ස්තූපයේ සුන්බුන් සහිත කලවම් පස් ස්තරයට පහළින් ගඩොල් උළු සහිත ගරා වැටුණු පස් ස්තරයත්, බටහිර පිවිසුම් දොරටුව සහිත මණ්ඩපයේ පාදමත් මතුකරගත හැකි විය (ඡායාරූප අංක 04).

පොකුණට උතුරින් ඇති පස් ගොඩැල්ල ද ස්තූප ප්‍රතිසංස්කරණ අවස්ථාවක ඉන් ඉවත් කළ ඒවා බව හඳුනාගත හැකි ය. 1952 වර්ෂයේ දී සෙනරත් පරණවිතාන ස්තූපයේ හතරැස් කොටුව සංරක්ෂණයට අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහනය පහසු කරගැනීමට නැගෙනහිර දෙසින් දාගැබේ හතරැස් කොටුව තෙක් පියගැට පෙළක් ඉදිකර තිබී ඇත. එහෙත් 1957 දී ඇද හැලුණු මහා වර්ෂාපතනය හමුවේ හතරැස් කොටුවේ කොටසක් ද ඉදි කළ පියගැට පෙළ සහිත නැගෙනහිර කොටස නාය ගොස් නැගෙනහිර ආයකය මතට ඇදහැලුණු බව පරණවිතාන 1959 දී වාර්තා කර ඇතැයි කුලතුංග උපුටා දක්වයි (කුලතුංග, 2014: 79-80). මෙම පොකුණ කැණීමේ දී ද එම සිදුවීමට අදාළ යැයි උපකල්පයනය කළ හැකි ගඩොළුමය බැමි කොටස් කිහිපයක් දක්නට ලැබුණි. උරුතු ඉවුරේ ස්තර අධ්‍යයනයේ දී මව් පාෂාණය මත විශේෂ බොරළු තට්ටුවක් හඳුනාගත හැකි විය. එම ස්තරයෙන් බහුලව කානීලියන්, පළිඟු හා දුම් පැහැ තිරුවාණා යන පාෂාණ වර්ග හමු විය. එම පාෂාණවලින් සැකසූ පබළු කොටස් හා පතුරු කැබලි බහුල ව හමු විය. එම ස්තරය අනාගත පර්යේෂණ සඳහා වසා දැමීමට තීරණය කෙරුණි.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

### 1. පියගැට පෙළ හා මාලක වේදිකා

කැණීම කිරීමෙන් අනාවරණය වූ සාධකවලට අනුව එය රවුම් හැඩයේ පොකුණක් බව තහවුරු විය. පොකුණේ උපරිම විශ්කම්භය මීටර් 25.5කි. පොකුණට බැසීම සඳහා පියගැට සහිත දොරටු දෙකක් හඳුනාගත හැකි විය. එහි ප්‍රධාන දොරටුව බටහිර දෙසින්

යොදා තිබුණු අතර එය මණ්ඩපයකින් ද සමන්විත වෙයි. අනෙක් දොරටුව සහිත පියගැටපෙළෙහි නටබුන් දකුණු දෙසින් අනාවරණය විය. (ඡායාරූප අංක 04). එම දොරටුවට අයත් ගල් කණු, යටෙලිපත, පඩි ගල් හා කුඩා මණ්ඩපය සහ පහළට තල්ලු වී ගොස් ඇති බව පෙනෙන්නට තිබුණි. එම පඩිගල්වලට පහළින් ප්‍රමාණ දෙකකින් යුතු මුරගල් දෙකක් ද හමු විය (ඡායාරූප අංක 05, 06). ඉන් එක් මුරගලක පුන් කලසකට සමාන කැටයමකි. බටහිර ප්‍රවේශ මාර්ගය සකස් කිරීමේ දි පොකුණේ මව් පාෂාණයට හේත්තු වන පරිදි කළුගල් පුවරු වද්දා වෙර ගන්වා තිබිණි. පොකුණ තුළට දිවෙන පියගැට පන්තියේ ආනතිය වැඩි වුවහොත් එය ගරාවැටීමේ අවදානමක් හා පොකුණට බැසීම වෙහෙස කරවන හෙයින් මතුපිට මණ්ඩපයේ සිට මාලක පහක් වන සේ පියගැට පන්තිය සකසා තිබීම විශේෂ ලක්ෂණයකි. පඩි පෙළෙහි දිශාව ද වරින්වර වෙනස් කර ඇත. පියගැට පෙළ සිව්වන හා පස්වන වේදිකා මව් පාෂාණය සමතලා කිරීමෙන් සකසා ගෙන ඇත. මේ අනුව පොකුණේ ජල මට්ටම ක්‍රමයෙන් අඩුවන විට පහළට බැසීමට හැකිවන පරිදි පියගැටපෙළ සකස් කර ඇති ආකාරය හඳුනා ගත හැකි වෙයි. ශිලා පුවරු වේදිකාවේ සිට පහළ මට්ටම තෙක් උස මීටර් 05. 5කි. පියගැට පෙළ නිර්මාණය සඳහා සකස් කර ඇති එම ශිලා පුවරු වේදිකාවේ දිග මීටර් 4.2ක්, පළල මීටර් 3.5ක් ද, එම වේදිකාව පිහිටුවා ඇති මව් පාෂාණය දක්වා උස මීටර් 2.5 කි. මව් පාෂාණය ද ගල් පුවරු හැඩය පෙනෙන සේ සකසා ඇත.

**2. පාදෙණිය**

පොකුණට නිරිත දෙසින් බැවුමට පෙරළී පසින් යටව තිබී අනාවරණය වූ ශිලාමය නිර්මාණය ජල භාජනයකි (ඡායාරූප අංක 07). එය කොටස් 9කට කැඩී විසිරී තිබුණි. එම කොටස් එකතු කර සම්පූර්ණ ශිලාමය ජල භාජනය නැවත සකස් කිරීමට හැකි විය. එවිට ශිලාමය භාජනයේ දිග සෙ.මී. 115ක් හා පළල සෙ.මී. 114ක් හා ගැඹුර සෙ.මී. 26 ක් විය. මෙවැනි ජල භාජන පාදෙණි වශයෙන් හඳුනාගත හැකි වෙයි. පාදෙණි යන වචනය සඳහා සුමංගල ශබ්දකෝෂයෙන් අර්ථ දක්වා ඇත්තේ පා සෝදන තැන වූ ද්‍රෝණිය වශයෙනි (සෝරත හිමි 1970:582). මෙබඳු පාදෙණි පැරණි ආරාම භූමිවල නො අඩුව දැකගත හැකි ය. සිව්වන කාශ්‍යප (ක්‍රි.ව. 914:923) රාජ්‍ය සමයට අයත් පොලොන්නරු බලකොටුවේ බටහිර දොරටුව අබියස ටැම් ලිපියක අභයගිරි විහාරයේ **මහසල පිළිම** වහන්සේගේ ගෘහයෙහි දොරටුව අබියස ''**තිඩිත්තු**'' නැමැත්තෙකු හා ඔහුගේ දරු මුණුබුරන් විසින් තැන්පත් කළ පාදෙණියක් පිළිබඳ සඳහන් ය. ''**අභයගිරි වෙහෙර මහසල් පිළිම බුදුන්වහන්සේගේ දොර මෙකු කැර වූ පාදෙණියෙ**'' යනුවෙන් එහි සඳහන් ය (Ranawella 2001:188). එසේ ම සිරිමල් රණවැල්ල විසින් සිව්වන දප්පුල (ක්‍රි.ව. 924-935) රාජ්‍ය සමයට අයත් කොට දක්වන ''**කුඹුක්වැව**'' ටැම් ලිපියෙන් ද ''**කීර්ති**'' නමැති තවත් පුද්ගලයෙකු අභයගිරි විහාරයේ පිළිමගෙයි දොරටුවෙහි පාදෙණියක් කරවීමක් ගැන සඳහන් වේ (Ranawella 2004:20). උක්ත ඉදිරිපත් කළ ලිපි දෙකෙන් ම පාදෙණිවල කටයුතු පවත්වාගෙන යාම සඳහා මෙහෙකාරියන් පත්කළ බව ද වාර්තා වේ.

**3. ශිලාලේඛනය**

2025 ඔක්තෝම්බර් මාසයේ දී බටහිර වේදිකාවේ සංරක්ෂණ කටයුතු අතරතුර, ව්‍යාපෘති කළමනාකරු තුසිත හේරත් විසින් ගල් පුවරුවක තිබූ කෙටුම් ලකුණු නිරීක්ෂණය කර මෙම ලිපිය හඳුනා ගන්නා ලදි (ඡායාරූප 08, 09). ලිපිය සහිත පුවරුව දිගින් සෙ.මී. 56ක් සහ පළලින් සෙ.මී. 30ක් වන ගල් ටැඹක කොටසකි. එහි අක්ෂරයක උපරිම උස සෙ.මී. 10ක් සහ පළල සෙ.මී.

0.5ක් පමණ වේ. පුවරුව දෙපසින් ම කැඩී ඇති බැවින් පූර්ණ පෙළ අසම්පූර්ණ ය. අක්ෂරයක උපරිම උස සෙ. මී. 10ක් පමණ වන අතර පළල සෙ. මී. 0.5කි. එම පුවරුව දෙපසින් ම කැඩී ගොස් තිබෙන හෙයින් පූර්ණ අර්ථ ගැනීම දුෂ්කර වෙයි. අක්ෂර ලක්ෂණ අනුව සෙල්ලිපිය ක්‍රි:ව: හතරවන සියවසට අයත් සේ සැලකීමට හැකි ය.

**ලිපියේ පෙළ**



ඡායාරූප 01 ශිලාලේඛන

1. ---**අවෙසිය නකය රටිහ**

2. ---**කරියවහි විසිය කහව**

3. ---**කවණහි වෙඩ ගෙගෙන ජිණකබ(ලි)**

4. ---**තලච ගිලනවට ච වය දින**

අර්ථ -------වාසය කරන රටික නාග විසින්------කරීසයෙහි කහවණු විස්සක් ----------කහවණුවල පොළිය ගෙන දිරුම් කවුළු ---------ගිලන් වැට සඳහා දෙන ලදි.

මුල් පෙළ මුල් වචනය අපැහැදිලි බැවින් නගරයෙහි නමක් සටහන් කර තිබෙන්නට ඇති බව පෙනේ. එම 'නගරයේ වාසය කරන නාග නමැත්තෙකු විසින් කරිසයෙහි කහවණු විස්සක් (තැන්පත් කර හෝ ආයෝජනය කර එම කහවණුවල පොලිය ගෙන දිරුම් කවුළු--

ගිලන්වැට හෙවත් ගිලන් වෘත්තිය සඳහා පූජා කරන ලදි'.

උක්ත ශිලා ලිපියේ අන්තර්ගත කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙහි දායකයා රටික නම් තනතුරක් දැරූ නාග නමැත්තෙක් බව සිතිය හැකි ය. ඒ අනුව ඔහු රාජ්‍ය නිලධාරියෙකි. පාලි **රට්ඨ** යන පදය සිංහලයට **රට** හෝ **රටි** වශයෙන් බිඳ ගත් බව පෙනී යයි. සී. ඩබ්ලිව්. නිකලස් සඳහන් කරන්නේ **රට** යන්න පැරණි පාලන ඒකකයක් බවත්, එය වර්තමාන දිස්ත්‍රික්කයට සමාන විය හැකි බවත් ය. **වග** හෝ **වක** යන්නත් මෙයට යෙදෙන තවත් නමක් ලෙස ඔහු වැඩි දුරටත් දක්වයි. (නිකොලොස් 1964 : 14) කණිට්ඨ තිස්ස රජු (ක්‍රි. ව. 167-186) ට අයත් **ලයිනමලේ** සෙල්ලිපියක ද, ඒ ආසන්න කාලයට අයත්වන **දක්ඛිණථූප** ලිපියක ද **රටිකයන්** පිළිබඳ සඳහන් ව ඇත (paranavitana 2001:138,166). මේ අනුව ලිපියෙහි සඳහන් **රටික නාග** උසස් රාජ්‍ය නිලධාරියෙකු බව පෙනී යයි.

මෙහි එන කරිය යන වචනයෙන් පැරණි භූමි මිණුමක් අදහස් කෙරෙයි. මෙම **කරිහ** හෙවත් **කරීස** යන පදය සෙල්ලිපිවල විවිධ ස්වරූපවලින් යෙදී ඇත. මෙම වචනය මුලින් ම හමුවන්නේ තන්තිරිමලයට නුදුරු **බිල්ලෑවේගල** ලෙන් ලිපියකිනි. එහි අඩ **කරිහ** යනුවෙන් සඳහන් ය (paranavitana 1970 :88 No 1118). **කරහක** යනුවෙන් **කයිකාවල** ලෙන් ලිපියක සඳහන් ය. ( Ibid: 99, NO 1226 ) මේ හැර විවිධ සෙල්ලපිවල **කරිය, කරිහිකි, කරිහක, කරහක, කිරි, කිරික්** ආදී වශයෙන් ද  සඳහන් ව ඇත (වජිර හිමි 1994:14). කරීසයක්, යනු අමුණු හතරක් වන අතර අක්කරවලින් 8 හෝ 10ක් බව ගයිගර් සඳහන් කරයි (ගයිගර් 1969 : 121). මෙම ලිපියෙහි පූර්ණ පෙළ ආරක්ෂා වී නොමැති හෙයින් ඍජු අදහසක් දීමට නොහැකි වුවත් කහවණු විස්සක පොළියෙන් දිරුම් නඩත්තු කිරීමත්, ගිලන් වැට පවත්වා ගෙන යාමටත් නියම කොට ඇත. මෙහි එන **ජිණ කබලි** යන්න දිරුම් කවුළු වශයෙන් ගත හැකි ය. පාලි ජිණ්ණ යන පදයෙහි දිරාගිය යන අරුත් ඇත. (බුද්ධදත්ත හිමි, 1950:209) කබලි යනු කවුළු ලෙස ගත හැකිය. කබලි යන පදයේ නිවැරදි ම යෙදුම **කබළි** විය යුතු වුවත් භාෂාවේ පරිවර්තන යුගයක මෙසේ දන්තජ, වෙනුවට මූර්ධජ **ළ** අවිශේෂයෙන් යෙදිය හැකි ය. කබළියන පදයට ශබ්කෝෂ යන්හි කවුළු යන අරුත් දී ඇත (සෝරත හිමි 1963: 233). ඒ අනුව භික්ෂූන්ගේ සිව් පසයෙන් තුන්වන අංගය වන සේනාසන යන්න දිරුම් නඩත්තුවෙන් ආවරණය වන අතර එහි හතරවන අංගය වන ගිලාන පච්චය යන්න ගිලන් වැට පවත්වාගෙන යාමෙන් ආවරණය වෙයි. මෙහි විශේෂයෙන් අදහස් කරන්නට ඇත්තේ ගිලන් වත හෙවත් ගිලනුන්ට කළ යුතු සත්කාර පවත්වාගෙන යාම බව සිතිය හැකි ය. තෝනිගල ලිපිය හා තවත් ලිපිවල එන 'දනවට' යන්නට පරණවිතාන ලබා දි ඇති අර්ථය දන්වැට හෙවත් පිසූ ආහාර පූජාව පවත්ගෙන යෑම වශයෙනි (paranavitana 1933 :172). ඒ අනුව ගිලන වට යන්න ද ගිලන් වෘත්තිය පවත්වාගෙන යෑම ලෙස ගත හැකි ය. මෙයට ම සමකාලීන ප්‍රකාශයට පත් ව ඇති ගජබා රජුට අයත් සිතුල්පව්ව විරයේ ගිරි ලිපියක එක දිනකට කහවණු දෙක බැගින් චිත්තල පබ්බත විහාරයේ භික්ෂූන්ගේ බෙහෙත් පිණිස ගැනීමට නියම කර ඇත (Paranavitana, 1983: 95-96). ගිලන් උවටා යන පදයට සුමංගල ශබ්දකෝෂයේ ගිලනුන්ට උපස්ථාන කරන්නා යන අරුත් දී ඇත (සෝරත හිමි 1963: 337). උක්ත කරුණුවලට අනුව මෙම ලිපියෙන් අභයගිරි ආරාමයට අයත් දුර්ලභ කරුණු කීපයක් අනාවරණය වෙයි.

## නිගමන හා නිර්දේශ

අභයගිරි දාගැබට නැගෙනහිරින් වූ පොකුණෙහි වාස්තුවිද්‍යාත්මක සාධක අභයගිරි ස්තූපයේ අනෙකුත් පිවිසුම් දොරටු ආසන්න ව ඇති පොකුණු හා සන්සන්දනාත්මක ව බැලූ විට වැදගත් කරුණු කිහිපයක් ගම්‍ය වේ. ඉන් එකක් නම් දාගැබ ආසන්නයෙහි ඇති අනෙකුත් පොකුණුවල දක්නට නොමැති පරිදි පොකුණේ පහළ මට්ටම තෙක් ම මාලක පහකින් යුතු ව බටහිර පියගැට පෙළ නිර්මාණය කර තිබීම යි. පඩි පෙළ ඉහළ මණ්ඩපයේ දොරගල හෝ යටලිපත ශේෂ ව පැවතීමෙන් පෙනී යන්නේ එම ප්‍රවේශ දොර ආවරණයන් සහිත ව ආරක්ෂිත ව නිර්මාණය කර තිබූ බවකි. පොකුණ නිර්මාණය කිරීමේ දී ජලය පහසුවෙන් කාන්දු නොවන පරිදි මව් පාෂාණය දක්වා පස් ඉවත්කර පොකුණ නිමවා ඇති බව පැහැදිලි වෙයි. භූමි පරිභෝජනයේ හා ජල කළමනාකරණය කිරීම කෙරෙහි අපේ පැරැන්නන් දැක් වූ කුශලතාව මෙම පොකුණෙහි ඉදිකිරීම් ලක්ෂණ අධ්‍යයනයෙන් පැහැදිලි වෙයි. පොකුණ කැණීමේ දී හමු වු ශිලාලේඛනයේ අන්තර්ගතය සැලකීමේ දී ලිපිය පොකුණ සමඟ ඍජු සබඳතාවක්

නොදක්වයි. එය වෙනත් කිසියම් තැනක තිබී පොකුණෙහි කටයුතුවලට පශ්චාත්කාලීන ව යොදා ගත් එකක් බව පැහැදිලි වෙයි. මෙබඳු සෙල්ලිපි පශ්චාත්කාලීන ඉදිකිරීම් සඳහා යොදා ගැනීම් අභයගිරියෙහි ම මීට පෙර ස්ථාන කීපයකින් ම වාර්තා වී තිබේ (කුලතංග හා හෙට්ටිආරච්චි 2024: 47).

කෙසේ වෙතත් ලිපිවල අන්තර්ගතය අනුව මහා විහාර ආශ්‍රිත ව පැවති ස්ථාවර දීමනා, ගිලන් උපස්ථාන ක්‍රමවේද සහ රටික වැනි නිලධාරීන් ආරාම නඩත්තුවට දැක් වූ දායකත්වය පිළිබඳ වැදගත් සමාජ ආර්ථික තොරතුරු රැසක් අනාවරණය කරයි. මෙම අධ්‍යයනයේ දී නිර්දේශ කිහිපයක් ද ඉදිරිපත් කළ හැකි ය. ඒ අතර දැනට පාදාගෙන ඇති පොකුණ විද්‍යානුකූල ව සංරක්ෂණය කළ යුතු ය. එය මාර්ගයට මදක් ආසන්නයෙන් පවතින හෙයින් හා ගවයන් නිදැල්ලේ හැසිරෙන හෙයින් සුදුසු වැටක් යෙදීම යෝග්‍ය ය. මෙම දුර්ලභ ශිලා ලේඛනය සහ පාදෙණිය ආරක්ෂිත ස්ථානයක තැන්පත් කිරීම මෙන් ම සෙල්ලිපිය හා පොකුණ පිළිබඳ අධ්‍යයනය කිරීමට අපේක්ෂිත පර්යේෂකයන් හට අවස්ථාව සලසා දීම සුදුසු ය.

**ඵලක**

අභයගිරි ස්තූපය හා සතර දිශාවේ පොකුණුවල පිහිටීම



සැලසුම 01 ස්තූපය හා පොකුණු සතර

උපුටාගැනීම - ***Second Report of the Archaeological Excavetions***




සැලසුම 02

කැනීමෙන් නැගෙනහිර පොකුණ ආරම්භයේ සිට අවසානය දක්වා මතුකරගත් අයුරු



ඡායාරූප අංක 01 නැගෙනහිර පොකුණ කැණීම ආරම්භ කිරීම



ඡායාරූප අංක 02 පොකුණ පාදාගනිමින්



ඡායාරූප අංක 03 පාදාගත් පොකුණ ගුවනින්

පොකුණෙන් මතුකරගත් ඉදිකිරීම් සාධක, ශිලා නිර්මාණ හා ලිපිය පිහිටි ස්ථාන



ඡායාරූපය අංක 05 මුරගල



ඡායාරූපය අංක 06 මුරගල



ඡායාරූප අංක 07 පාදෙණිය



ඡායාරූප අංක 08 ශිලාලේඛනය



ඡායාරූප අංක 04 පාදාගත් පොකුණේ බටහිර හා උතුරු ප්‍රවේශ දොරටු නටබුන්

## මූලාශ්‍රය


අමරවංශ හිමි, කොත්මලේ, 2014 (නව මුද්‍රණය), *ලක්දිව සෙල්ලිපි,* සීමා සහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ , කොළඹ.

කුලතුංග, ටී. ජී, 2014, *පුරාණ අභයගිරි විහාරය,* මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ 07.

කුලතුංග, ටී. ජී, හා කරුණාසේන හෙට්ටිආරච්චි 2024, *අභයගිරි සෙල්ලිපි,* මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ 07.

ගුණවර්ධන, රණවීර, 1996, *සිවුර හා නගුල,* සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ 05.

ගයිගර්, විල්හෙම්, 1969, *මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය,* පරිවර්තනය ඇම්.ඩී. ආරියපාල, ඇම්, ඩී. ගුණසේන සහ සමාගම.

නිකලස්, සී. ඩබ්ලිව්, 1979, *පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය,* සිංහල පරිවර්තනය සෝමපාල ජයවර්ධන , තිසර ප්‍රකාශකයෝ , දෙහිවල.

*පාහියන්ගේ දේශාටන වාර්තාව* , 1958 අනුවාදය බලගල්ලේ විමලබුද්ධි ස්ථවිර , ඇම්. ඩී. ගුණසේන සහ සමාගම ,කොළඹ

බද්ධදත්ත හිමි, පොල්වත්තේ, 1950, *පාලි සිංහල අකාරාදිය,* ඇම්. ඩී. ගුණසේන සහ සමාගම ,කොළඹ

*මහාවංශය* , 1967 ,සංස් : එච් . සුමංගල හිමි සහ බටුවන්තුඩාව රත්නකාර මුද්‍රණ , කොළඹ.

රණවැල්ල , සිරිමල්., 2004 , *සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය,* පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

වජිර හිමි , හබරකඩ , 1994 , ''දෙවන භාතික තිස්ස රජුගේ අභයගිරි ශිලා ලේඛනය'', *සංස්කෘතික පුරාණය* , 08 වන කලාපය සංස් : ටී. ජී. කුලතුංග . මධ්‍යම සංස්කෘතික අරමුදල , කොළඹ.

වජිර හිමි, හබරකඩ, 1996, ලංකාවේ පොකුණු නිර්මාණයේ ඓතිහාසික පසුබිම, *සංස්කෘතික පුරාණය,* 1 වෙළුම, 2 කලාපය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ 07.

සෝරත හිමි, වැලිවිටියේ., 1963, *සුමංගල ශබ්ද කෝෂය* (ප්‍රථම භාගය), අනුල මුද්‍රණ, කොළඹ.

සෝරත හිමි, වැලිවිටියේ., 1970 *සුමංගල ශබ්ද කෝෂය* (ද්විතීය භාගය), අනුල මුද්‍රණ, කොළඹ.

Paranavitana . s .1933, **Epigraphia zelanica vol**, iii Archaeological survey of Ceylon, oxford university press, Amen house, London.

Paranavitana . s .1983, **Inscription of Ceylon**, vol ii, Archaeological survey of Ceylon , published by the Department of Archaeology, Sri Lanka

Paranavitana . s .2001**, Inscription of Ceylon**, vol ii part ii, Archaeological survey of Ceylon , published by the Department of Archaeology, Sri Lanka.

Ranawella, S., 2001 **Inscriptions of Ceylon** Vol. V, Part I, Department of Archaeoogy, Colombo.

Ranawella, S., 2001, **Inscriptions of Ceylon,** Vol. V, Part II, Department of Archaeoogy, Colombo.

Ranwella, Sisrimal, 2005, **Inscriptions of Ceylon vol**. V part III Archoelogical survey of Ceylon published by Department of Archaelogy, Sri lanka